චානක ඉලංගගේ 365 දින ලිපි

ඔබට ජයවර්ධනයන්ව මුලින්ම හමුවන්නේ කෙසේද කොතැනදීද .?

මට මුලින්ම එච්.එම් ජයවර්ධනයන්ව මුණගැසෙන්නේ සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සංගීතය හදාරන අවදියේදියි. කිසියම් කටයුත්තක් සඳහා මම යනවා ඔහුව හොයාගෙන ශබ්ධාගාරයකට .කොහොම හමුත් මට අවස්ථාව ලැබෙනවා බටහළා ශිල්පියෙකු ලෙස එදිනම ඔහුත් සමග පරිගත කිරිමකට එක්වන්න. එහෙම තමයි පළමු මුණ ගැසීම සිදුවන්නේ .පසු කලක මම ඔහුගේ ළමම ඥාතියෙක් වෙනවා. ඒ තමයි දෙවන හමුවීම .

නිරායාස සෞන්දර්යෙන් අගතැම්පත් සත්‍යශීලී නිර්ව්‍යාජ කලාකරුවෙක් තමයි එච්.එම් කියන්නේ . 1983 මුහුදු ලිහිණි චිත්‍රපටයට ඔහුට ලැබුණු වසරේ හොඳම සංගීත අධක්ෂණයට හිමි ජනාධිපති සම්මානය ඔහු ඉතාම පැහැදිලි ලෙස ප්‍රතික්ෂේප කරමින් එය තුන්වෙනි යාමය චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂක ප්‍රේමසිරි කේමදාස මහතාට ලබාදීම . සම්මාන වලට පොරකන සම්මාන සඳහා කුපන් පත්තර පුරවා හරින කෘදර සමාජයක තාමාට ලැබුන සම්මානය එපා කියන එහෙම ගෞරවණීය චරිතයක් තමයි එච්.එම් ජයවර්ධන කියන්නේ .

සංගීතඥ එච්.එම් ජයවර්ධන කියන්නේ සිංහල සංගීතයේ ආවර්තය ලක්ෂයයි .එයට හේතුව කෙනෙකුට අත්පත් කරගැනීමට අපහසු නිර්ව්‍යාජ නිරායාස සුන්දරත්වයකින් යුත් සංගීතයක් බිහිකළ පළමුවැන්නා ඔහු වීමයි .සියඹලාණ්ඩුව නමැති හිනඩ හිස්කලංක අපිස්ගුණය සපිරි පරිසරයක හැදී වැඩුන ජයවර්ධනයන් ඒ පරිසරය සමග සංජානනය කරගත් ලියදමේ රිද්මය තමයි ඔහුගේ නිර්මාණවලට ආත්ම බද්ධ වන්න ඇත්තේ . කිසිම ශාස්ත්‍ර පීඩයකින් පෙර අපරදෙදිග සංගීතය පිළිබඳව ලබාගත් ලියවිල්ලක් සහතික පතක් නොමැති ජයවර්ධනයන් ජන හඳවත්වල ප්‍රේමාභිෂේක වන්නේ ඔහුගේ නිර්මාණ ජනතාවට ආමන්ත්‍රණය කල නිසා. ඒ ඔහුගේ තනුවල තිබෙන නිර්ව්‍යාජ නිරායාස සුන්දරත්වය නිසා. ගුත්තිලය යශෝදරාවත වැනි කාව්‍ය සංග්‍රහ ලියූ කවීන් ලග දැකිය හැකි ගලාගේනයන දුෂ්කර බන්ධන නැති විවිධූරන වලින් තොර නොකිළිටි කෝමල ප්‍රකාශන මාදිළිය අත්පත්කරගත් අපේ කාලයේ සංගීතඥයා තමයි එච්.එම් .

නාදයේ ඇති සුමට කෝමළ සුගම තැන් අනුසාරයෙන් නිර්මාණ කරණයේ යෙදෙන එච්.එම් ජයවර්ධනයන් සංගීත වේදයේදී හඳුන්වන ඩයිනමික් ටයිප් නැතිනම් ඝාතික වර්ගයේ සංගීතඥයෙක් විදිහට තමයි මම දකින්නේ .ඔහුට මේ ගමන මෙතරම් දුරක් එන්න විශාරද මාලනී බුලත්සිංහලගෙන් ලැබුනු දායකත්වයද සුළුපටු නැත .ඔහු කිසිම දිනක ඔහු වෙනුවෙන් නමක් හදාගන්න අහස්ගඟවට නැගල යන්න එහෙම උද්යෝගවෙච්ච චරිතයක් නොවෙයි .මාලනිය තමයි ඔහුව මේ ගමන මේතාක් දුර ගෙනෙන්නේ .මේ ගමනට අත්වැලක් වන්නේ .රටක් කතාකරන මහා චරිතයක් කරන්නේ ඇයයි .

ඔහු ප්‍රතිභා සම්පන්න සංගීතඥයෙකු වීම මේ ආත්මයේ පමණක් සංජානනය වීම මත සිදුවූවක් නොව එය පුරාකෘත පුණ්‍යමහිමයත් සංසාරගත පුරුදුදත් යන සියලු කරුණුවල එකතුවක් ලෙසයි මා දකින්නේ .

ටී .එම් ජයරත්නයන්ට නිර්මාණය කල ඔබ හා මෙමා හා තන්දා මාලනියට තැනු මදුර ප්‍රේම කල්පණා යන ගීත දෙකම ඔහු නිර්මාණය කරන්නේ උත්තරභාරතීය සංගීතයේ එන මදුමත් සාරාංගය නමැති රාගය ඇසුරු කරගෙන .උත්තරභාරතීය රාගධාරි සංගීතය අනුසාරයෙන් බිහිවූ සිංහල ගීත පිළිබඳව පර්යේෂණයක් කල දිවංගත වික්ටර් පෙරේරා ශූරින් වරක් එච්.එම් ගෙන් අසනවා ඔබට කොහෙදිද මදුමත් සාරාංගය අසන්න ලැබුනේ කියා .එච්.එම් කියුවලු ඔය නමත් ඇහුවේ අද තමයි කියලා . ඔහු නිර්මාණය කල තනු අතර ආචාර්ය වික්ටර් රත්නායකට තැනු සීතල පිනි බින්දු බින්දු .තුරු ලපලු ලතාවෝ නන්දාමාලනීට තැනු ඔබයි රමය සඳ කිරණ .මේජීවන ගංගා දාරේ .මදුර ප්‍රේම කල්පණා . වැනි නිර්මාණ දෙස බැලීමේදී හැඟෙන කරුණක් තමයි මේ ජීවිතයේදී නැතත් සසර මග කොහේදී හෝ තැනකදී ඔහු මේ ගාන්ධර්ව වේදය දිගු පුළුලින් හදාරා බොහෝ රස උත්කර්ෂණයට පාත්‍ර වූ චරිතයක් බව .නිර්මාණවේදී සංවේදිනාව කියන කාරණය ජයවර්ධනයන්ට උපතින්ම ලැබුනු තෑග්ගක් .

සිංහල සිනමාවේ චිත්‍රපට දහයක හෝ දොළහක පමණ සංගීතය නිර්මාණය කරන එච්.එම් සිනමාව ඔස්සේ වැඩිදුරක් නොයන්න හේතුව සමහරවිට නිෂ්පාදකවරු පවා ගිතන්න ඇති ලැබෙන සම්මානය වත් නොගන්න පුද්ගලයෙකුට කියා වාණිජ වටිනාකමත් ඇති නිර්මාණයක් කරගැනීමට අපහසුනේදැයි කියන කාරණය . නමුත් මේ ගිලිගීම පිළිබඳව එච්.එම් ට අල්ප මාත්‍රයකවත් අසතුටක් නෑ ඔහු එතැනින් ගිලිගී මහා ජනකායෙන් ගිලිගී තනිවන තරමටම ඔහු කැමති .

එච්.එම් ගෙන් පසුව ඔහුගේ තැන ගන්න ඉන්නේ කවුද .?

එහෙම කෙනෙක් අද දවසේ නෑ . පෙනෙන තෙක් මානයකවත් නෑ. කලාව සෑමවිටම කේන්ද්‍රීය වන්නේ පවත්නා සමාජ ආර්ථික ක්‍රමයේ රිද්මාකාරය මත .එච්.එම් ට ප්‍රමුදිත වන්න නිදහසේ ස්වාධීනව සිතන්න පුළුවන් රමණීයත්වයක් එච්.එම් ජීවත් වූ සමාජ ආර්ථික පරිසරයේ ඇතුලේ තිබුනි . නමුත් වර්තමාන පරම්පරාවට තිබෙන ගැටලුව තමයි ඔය සම්ප්‍රදාය අත්පත්කර ගැනීමේ ගැටලුව . අපිට තිබුන ජනකථා ජන ගී ජන රිද්මය පරිශීලනය කිරීමේ අවස්ථාව වර්තමාන පරපුරට අද නෑ .අද අපි ඉන්නේ සියලුමදේ වාණිජ කරණය වෙච්ච ආස්වාදය ප්‍රාග්ධනයෙන් විසංධි වෙච්ච සමාජයක .එහෙව් සමාජයක කොහොමද අපි එච්.එම් ගේ අනුප්‍රාප්තිකයෙක් සොයාගන්නේ .ඔහු පරිසරයෙන් උකහා ගත් සියලුදේ නිර්මාණ කරණය ඔස්සේ ආපසු පෙරලා මේ සමාජයටම ලබාදුන්නා. එච්.එම් ශාෂ්ත්‍රාලීය වශයෙන් හැදෑරුවේ නැති උවත් ඔහු ජීවත්වුණු පරිසරයේ තිබුණු පරිචාරක සංස්කෘතික අනුහස තමයි ඔහුව මහා සංගීතඥයෙකු කරන්නේ .අද අවාසනාවකට එහෙම පරිසරයක් නෑ .

ආචාර්ය ප්‍රේමසිරි කේමදාස ගෙන් පසුව ඒ තැන අත්පත් කරගන්න සිටි සංගීතඥයා තමයි එච්.එම් ජයවර්ධනයන් .නමුත් කුමක් හෝ අභාගයකට ඔහු එතනින් ඉදිරියට වැඩුන්නෑ.ඔහුට සහජ ප්‍රතිභාව තිබුනා ඔහු ජීවත් වූ ශිල්පීය පරිසරය තුල නිර්මාණ කරණයට අනුබල දෙන සංස්කෘතික උත්තේජනය තිබුන ඔහුට නිවසේ සංගීත ඇසුර තිබුන මාලනී බුලත්සිංහල මහත්මියගෙන්. නමුත් කුමක් හෝ හේතුවකට ඔහු ඔහුට සහජයෙන් ලැබුණු කොටසට එහා ඔහුගේ හැකියාව සුසංයෝජනය කරගත යුතුයැයි යන හැඟීමක් තිබුනේ නැහැ .එහෙම කලානම් කේමදාසයන්ගේ තැන ඉතා සුවිසල්ව අත්පත් කර ගන්න තිබු දැවැන්තම පුද්ගලයා එච්.එම් වන්න තිබුනා.

එච්.එම් ජයවර්ධනයන්ගේ නිර්මාණ තුල බොහෝවිට දකින්න ලැබෙන්නේ දුක නැතිවීම අතහැරීම වැනි භාවප්‍රකාශනයක් .ඔහු භාවිතා කරන මේ සංගීත සම්ප්‍රදාය කුමක්ද .?

ලාංකීය ජීවන සංස්කෘතිය තුලවූ ඉතාම සානුකම්පිත අවිහිංසාවාදී දයාබර දෘෂ්ඨිය තමයි මා දකින විදිහට එච්.එම් ඇසුරුකළ ජීවන සම්ප්‍රදාය .අන්න ඒ සම්ප්‍රදායම තමයි ඔහු ඔහුගේ නිර්මාණ කරනයේදීත් භාවිතා කරන්නේ .සංස්කෘත කාව්‍ය විචාරයේදී කියනවා ,සියලුම දේවල් අයිති කරුණ රසයට.සෑම දෙයක්ම අවසන්වන්නේ කඳුලින්ය කියා .ඔහු බොහෝ නිර්මාණ කර ඇත්තේ ඔහු ජීවත් වූ පරිසරයේ ජීවන අත්දැකීම්වලට යටත්ව මිස පාරිභෝගික සමාජයේ හැඩවලට අනුව නොවෙයි .එච්.එම් ගේ තනු අපිට අපේ යැයි හැඟෙන්නේ අන්න ඒ නිසයි

එක්තරා තැනකදී මම ඔහුගෙන් අහනවා ඔබ ඔබේ නිර්මාණ තුලින් බලාපොරොත්තු වන්නේ කුමක්ද කියා .ඔහු කියනවා , මගේ නිර්මාණයකින් හෝ වෙන කෙනෙකුගේ නිර්මාණයකින් හෝ මට පුලුවන්නම් එක අහල ඇහැට කඳුළු එන මට්ටමට එන්න මම හිතන සංගීතය තියෙන්නේ එතන කියල .

අප්‍රකට කරුණක් තමයි එච්.එම් ගායකයෙක් සහ බටහළා ශිල්පියෙක් කියන කරුණ .ඔහු ගායනා කළා , ගංගාව මමයි අද දින මහ සයුර දකින්නම් , කියන ගීතය .මේ ගීතය ඔහුට රචනා කරන්නේ ආනන්ද පද්මසිරි කියන දක්ෂ ගේය පද රචකයා . මට ඇත්තටම හිතෙනවා ආනන්ද මේ ගීතය හරියට එච්. එම් ගැනම හිතල ලියුව ගීතයක්වද්ද කියල . එහි මෙහෙම කියනවා

ගංගාව මම යි අද දින මහා සයුර දකින්නම්
ගං දෑලවරේ මට හමුවූ ඔබට ආයුබෝවන්

උල්පතකින් බිහිවූ මා
ගඟක් වෙලා යුග ගානේ ගැලූ ගමන් මගේ
නේක දසුන් දුටුවා නේක වදන් ඇසුවා
කාලය කළ පෙරලි මැදින් බාදක බිඳ ආවා

මා සරුකළ බිම් මලින් එලින් පිරෙවී
මා ගැලූ මගිම ඉතිහාසය කියාවී
මගෙන් දිය බිව්වො මිහුදට ආවඩාවී
කාලගුණ දන්නෝ මගේ මෙහෙවර සිහි කරාවී
මා නමින් නිමල කුසුමක් ඒ සිත්තුල සුපිපුනාවේ

ගංගාව මමයි
එච්.එම් ජයවර්ධන